අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 01/2023

මගේ අංකය :- BD/GH/CPHMA/01/2013,
පළාත් මහ රෝහල,
බදුල්ල.

2023.05. 14

සියලුම ඒකක/ අංශ ප්‍රධානීන්

**බදුල්ල පළාත් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කිරීම අනුව ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය**

ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ නව වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීම ප්‍රකාශයට පත් කිරීම සමග නව පීඨයේ සිසුන්ට සායනික පුහුණුව ලබා දීම සඳහා පහසුකම් සැලසීමට බදුල්ල පළාත් මහ රෝහල තෝරා ගැනීමෙන් පසු උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් සංවර්ධනයට බදුල්ල පළාත් මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කිරීමේ ගැසට් නිවේදනය 2023.05.12 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇත.

02. එම උත්ශ්‍රේණිගත කිරීම අනුව ආයතනයේ නම "ශික්ෂණ රෝහල, බදුල්ල" ලෙස භාවිතා කළ යුතු අතර ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ජූනි මස දෙවන සතියේදී බදුල්ල පළාත් මහ රෝහලේ පැවැත්වෙන නිල උත්සවයකින් මේ බව නිල වශයෙන් සනිටුහන් කිරීමට නියමිතය.

03. එබැවින් රෝහලෙහි නාමය "ශික්ෂණ රෝහල, බදුල්ල" ලෙස වෙනස් වීම අනුව පහත උපදෙස් වලට අනුකූලව ඔබ ඒකකය/ අංශයේ සියළු කටයුතු සංවිධානය කර ගත යුතු බවත්, සියළු ලිපිලේඛන යාවත්කාලීන කර ගත යුතු බව/ යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බව මෙයින් දැනුම් දෙමි.

a.)

i. රෝහල් ලිපි ශීර්ෂයේ ත්‍රෛයි භාෂාත්‍රයෙන් නව නාමකරණය සටහන් විය යුතුය.

ii. අළුතින් ආරම්භ කරන සෑම ලිපි ගොණුවකම , ලේඛණයකම හා සායන පොත් ආදියෙහි නව නාමකරණය සටහන් විය යුතුය.

iii. දැනට භාවිතා කරන සන්නිවේදනය පොත්, ඖෂධ පොත් ආදි ලේඛනවල පිටකවරයේ ආයතනයේ නම ඇත්නම් එහි නාමය තත්ව කළමනාකරණ ඒකකයෙන් නිකුත් කර ඇති වර්ණ කේත අනුව නව නාමකරණය වෙනස් කළ යුතුය.

iv. සියළුම භාණ්ඩ හා උපකරණවල ආයතනයේ නම සටහන් කරන සෑම ස්ථානයකම නව නාමකරණය සටහන් කළ යුතුය.

v. දැනට භාවිතා කරනු ලබන සියළුම රබර් සීල්, දින මුද්‍රා ආදිය ක්‍රමානුකූලව වෙනස් කළ යුතුය.(පළමු අදියරට රෝහලෙන් බැහැර ආයතන වලට යැවීමට තැබෙන රබර් සීල්)

vi. ආයතනයේ නාමය සටහන් සියලුම නාම පුවරු වල ආයතනයේ නම නව නාමකරණය අනුව වෙනස් කළ යුතුය.

vii. දැනට මුද්‍රණය කර ඇති අභ්‍යන්තර ආකෘති පත්‍ර අවසන්ව නව ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමේ දී නව නාමකරණය යොදා වෙනස් කළ යුතුය

viii. රෝහල සතු සියලුම වාහන වල ආයතනයේ නම නව නාමකරණය අනුව වෙනස් කළ යුතුය.

ix. රෝහල් නිල වෙබ් අඩවියේ, හා ඊමේල් ලිපින වල නාමය හා රෝහල් කොඩියේ නාමය වෙනස් විය යුතුය.

xi. විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් යොමු කරන ලිපි වල ආයතනයේ නව නාමකරණය ඇතුලත් කිරීම

xii. පරිගණක මගින් ලබා ගන්නා (රසායනාගාර පරීක්ෂණ වැනි) වාර්තා වල ආයතනයේ නව නාමකරණය ඇතුලත් කිරීම

b) දැනට ලිපි ගොණු අංක කිරීම ආරම්භයේදී PGH/BD/.... ලෙස කර ඇති අංකිත ක්‍රමය TH/BD/..... ලෙස වෙනස් විය යුතුය.

c) ඌව පළාතේ සියළුම රාජ්‍ය ආයතනවලට රෝහලේ නාමය වෙනස්වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කළ යුතුය.

d) දුරකථන නාම ලේඛනයේ නම වෙනස් කිරීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට දැනුම් දීම සිදු කළ යුතුය.

e) දුරකතන, ජල, විදුලි බිල්පත් ආදියෙහි රෝහල් නාමය වෙනස් කිරීමට අදාළ ආයතන වලට දන්වා යැවිය යුතුය.

f) ඉදිරියේදී ලබා දෙන රාජකාරී හැඳුනුම්පතෙහි ද නව නාමකරණය ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.

g) රෝහල් කම්වු නිල ලිපි ශිර්ෂයද නව නාමකරණය අනුව වෙනස් කළ යුතුය.

අධ්‍යක්ෂ,

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

පළාත් මහ රෝහල,

බදුල්ල.

o/c

පිටපත් :-

01. AK විෂය භාර නිලධාරී - ඉදිරි මුද්‍රණ කටයුතු වලදී අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට

02. තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරී - අ.කා.ස